(84)
(38)

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2023 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2023. 05. 17 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහන තේරීම් කමිටු විසින් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හා නැවත ක්ෂේත්‍ර දත්ත සමීක්ෂණය සිදුකළ යුතු අවස්ථාන් පිළිබඳ මාර්ගෝපදේශය**

2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතට අනුව, තේරීම් කමිටු සඳහා සුබසාධක ප්‍රතිලාභ දීමනා අපේක්ෂා කරන අයදුම්කරුවන් විසින් සපයා ඇති දත්ත වල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සහ ඔවුන් විසින් සුදුසු බව නිගමනය කිරීම සඳහා තේරීම් කමිටුවට හැකියාවක් පවතින අතර ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත සිය නිර්දේශය ඉදිරිපත් කළ හැකිය.

02. අයදුම්කරු විසින් සපයන ලද ප්‍රකාශයේ දත්ත නිවැරදිව ලබා නොදුන් අයදුම්කරුවන්ගේ දත්ත පරීක්ෂා කිරීමේදී ඒවායේ වෙනස්කම් පැහැදිලිවම සාක්ෂි හා ලේඛන මත ඔප්පු කළ හැකි නම් එවැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට මෙන්ම ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරිගණක ක්‍රියාවලියට ඇතුළත් කිරීම තාවකාලික ලෙස නතර කළ හැකිය.

03. යම් අවස්ථාවක සපයා ඇති දත්තවල අපැහැදිලි බවක් පවතී නම් වැඩිදුර තොරතුරු ලබාගැනීමට ද සුබසාධක ප්‍රතිලාභ පනතට අනුව, තේරීම් කමිටුවට බලය තිබේ. එම තොරතුරු හෝ ලේඛන පදනම් කරගෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකි අතර එය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කළ යුතුය. එම ප්‍රතික්ෂේපිත අයදුම්පත් වලට අදාළ සාක්ෂි හෝ ලියවිලි සුරක්ෂිත ලෙස ගොනු කර තබා ගන්නා ලෙස දන්වා සිටිමි.

04. තේරීම් කමිටු විසින් පහත සඳහන් අවස්ථාවලදී අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකිය. (පසු පිටුවෙහි අදාළ වගුව සඳහන් කර ඇත).

→ (02)

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

| අනු අංකය | අවස්ථාව/ සිද්ධිය | අවශ්‍ය සාක්ෂි/ ලේඛන |
|---|---|---|
| 01 | විදෙස්ගත සාමාජිකයාගේ දත්ත වසන් කර ව්‍යාජ දත්ත ඉදිරිපත් කර තිබීම. | • ග්‍රාම නිලධාරී විසින් එම දත්ත ව්‍යාජ බව සහතික කිරීම. |
| 02 | රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවක නිරත පුද්ගලයා පවුලේ සාමාජිකත්වයෙන් වෙන් කර දත්ත ලබා දී තිබීම හා ආදායම සැඟවීම | • ඡන්ද හිමි නාම ලේඛනය අනුව ඔහු/ ඇය පවුලේ සාමාජිකයෙකු බව තහවුරු කරගැනීම. • ග්‍රාම නිලධාරී විසින් එම දත්ත සම්බන්ධව සහතික කිරීම • ග්‍රාමීය කමිටු වාර්තාවක් ලබාගැනීම. |
| 03 | එකම අයදුම්කරුවෙකු වෙනුවෙන් ලිපිනයන් දෙකකින් අයදුම්පත් දෙකක් ඉදිරිපත් කිරීම. | • ඔහුගේ අනන්‍යතාවය පරීක්ෂා කිරීම. • ග්‍රාම නිලධාරී විසින් එම දත්ත සහතික කිරීම. |
| 04 | වාහන සතු පුද්ගලයින් තම වාහන සම්බන්ධයෙන් දත්ත සැඟවීම සහ වාහන නොමැති බව සංගණන නිලධාරියාට පැවසීම. | • ආදායම් බලපත්‍ර දත්ත පද්ධතිය මඟින් තහවුරු කර ගැනීම. • ග්‍රාම නිලධාරී විසින් එම දත්ත සහතික කිරීම. • ග්‍රාමීය කමිටු වාර්තාවක් ලබාගැනීම. |
| 05 | අයදුම්කරු විසින් තමන් සතු ආදායම, වියදම වත්කම් පිළිබඳව පැහැදිලිව හඳුනා ගත හැකි වුවද ඒ පිළිබඳව සත්‍ය තොරතුරු ලබා නොදීම. | • පවතින ලියවිලි හා පවතින වෙනත් මූලාශ්‍ර • ග්‍රාමීය කමිටු වාර්තාවක් ලබාගැනීම |
| 06 | වගා කළ හැකි මඩ ඉඩම් සහ ගොඩ ඉඩම් | • පොහොර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ලේඛන • ගොවිජනසේවා පොහොර ලේඛනය |
| 07 | වයස්ගත මව/ පියා පවුලේ සාමාජිකත්වයෙන් වෙන් කර දක්වා වෙනම අයදුම්කරුවෙකු වශයෙන් අයදුම් කිරීම. (නමුත් ඡන්ද හිමි නාමලේඛනයේ එකම පවුලක් ලෙස දක්වා ඇත). | • පවුලේ සාමාජිකයෙකු බව ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීම. |
| 08 | තමන් සතු නිවසක් තිබියදීත් ඒ බව නොදන්නා සිටීම. | • නිවාස සම්බන්ධ දත්ත ග්‍රාම නිලධාරී මඟින් සහතික කිරීම. |

| | | |
|---|---|---|
| 09 | තමන් සතු ඉඩමක් තිබියදීත් ඒ බව නොදන්නා සිටීම හා ඒ සම්බන්ධයෙන් වන දත්ත අවම වශයෙන් සංගණන නිලධාරියාට ලබා දීම. | • ඉඩම් සම්බන්ධ දත්ත ග්‍රාම නිලධාරී මඟින් සහතික කිරීම. |
| 10 | අයදුම්කරු විසින් තමන් සතු යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දත්ත සැඟවීම. | • අයදුම්කරු සතු ව්‍යාපාර, ස්වයං රැකියා පිළිබඳ පෙර ලබා දී ඇති දත්ත සමඟ සැසඳීම. |
| 11 | හුදෙක් කෙසේ හෝ සුබසාධක ප්‍රතිලාභ ලබා ගැනීමේ පටු අරමුණින් චේතනාන්විත ලෙස සත්‍ය තොරතුරු සැඟවීම.<br>උදා. - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව නිසි ලෙස ඉදිරිපත් නොකිරීම, රැකියා නියුක්තික හෝ වෙනත් ආදායම් ලබන පුද්ගලයන් සිටී නම් දත්ත සමීක්ෂණය සිදු කරන අවස්ථාවේදී ඔවුන් මගහැර සිටීම. | • ඡන්ද හිමි නාම ලේඛනය අනුව පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව තහවුරු කිරීම.<br>• වැඩිදුර තොරතුරු දත්ත ග්‍රාම නිලධාරී මඟින් සහතික කිරීම. |
| 12 | ක්ෂේත්‍ර දත්ත සමීක්ෂණ නිලධාරියා නොමඟ යැවීමේ අරමුණින් පදිංචි නිවසින් පරිබාහිර වෙනත් නිවසක රැඳී සිට දත්ත ලබා දීම. | • ඡන්ද හිමි නාම ලේඛනය අනුව ගෘහ අංක පරීක්ෂා කිරීම හා පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව පරීක්ෂා කිරීම.<br>• වැඩිදුර තොරතුරු දත්ත ග්‍රාම නිලධාරී මඟින් සහතික කිරීම. |
| 13 | විශ්‍රාම වැටුප් ලබා ගන්නා බව සැඟවීම | • ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින දත්ත සහ තොරතුරු වලින් මේ බව තහවුරු කර ගැනීම. |

තේරීම් කමිටුව විසින් ක්ෂේත්‍ර දත්ත පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදී එම දත්තවල ගුණාත්මකභාවය, සත්‍යතාවය සහ නිවැරදිභාවය සම්බන්ධයෙන් තේරීම් කමිටුව සෑහීමකට පත් නොවන්නේ නම් එවැනි අවස්ථාවකදී තේරීම් කමිටුවට නැවත ක්ෂේත්‍ර දත්ත සමීක්ෂණය සඳහා නිර්දේශ කළ හැකිය.

01. දත්ත සමීක්ෂණ නිලධාරියා විසින් වැරදි දත්ත පද්ධතිගත කර තිබීම.
02. දත්ත සමීක්ෂණ නිලධාරියා නොසැලකිලිමත් ලෙස හෝ අනවබෝධයකින් යුතුව දත්ත රැස් කර තිබීම.
03. අසම්පූර්ණ තොරතුරු ලබා ගත් අයදුම්පත් තිබීම.
04. නිරවද්‍යතාවය පිළිබඳ තේරීම් කමිටුවට සෑහීමකට පත් විය නොහැකි වීම.

සුබසාධක ප්‍රතිලාභ පනතේ 10, 13 සහ 23 වගන්ති අනුව තේරීම් කමිටුවට මෙන්ම අවශ්‍ය වේ නම් අතිරේක තොරතුරු ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරයාට ද බලය ඇත.

*එමෙන්ම අයදුම්පත් සම්බන්ධ දත්ත සමීක්ෂණයේදී අදාළ දත්ත පිළිබඳ පැහැදිලි අනාවරණයක් ලබා ගත නොහැකි නම් එම අයදුම්පත් හුදෙක් නිරීක්ෂණ පමණක් ලෙස සටහන් කළ හැකිය.

→ (04)

මේ පිළිබඳව තේරීම් කමිටුවේ අවධානය යොමු කර කඩිනමින් අවශ්‍ය දත්ත සත්‍යාපනය කර ගැනීමට පියවර ගන්නා ලෙස ඉතා කාරුණිකව දන්වා සිටිමි.

බී. විජයරත්න
සභාපති/ කොමසාරිස්

පිටපත - සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කාරු.දැ.ගැ.ස.